මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2016
-----------------------------------------

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයට අදාළ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තිය සහ 2014 ඔක්තෝබර් 03 දිනැති අංක 1882/51 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ 17(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 49(1) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3. විගණකගේ වගකීම
--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1. මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මාතර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1. ගිණුම්කරණ අඩුපාඩු

මාතර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2013 නොවැම්බර් 27 දින යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට පවරා දී තිබුණු හෙක්ටයාර් 0.5854 ක ඉඩමේ සහ අමාත්‍යාංශය විසින් ඉදි කරනු ලැබූ ගොඩනැගිලි සංකීර්ණයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.2. විගණනය සඳහා සාක්ෂි නොවීම

විෂයයන් 04 ක් සඳහා බාහිර දේශකවරුන්ගේ දේශන පැය 95 ක් වෙනුවෙන් ගෙවා තිබුණු රු.95,250 ක දේශන ගාස්තුවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා එම දේශන වලට සහභාගි වූ ශිෂ්‍යයන්ගේ නාම ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 නීති රීති,රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 103 හා 104 | 2016 මැයි 15 හා 2016 ඔක්තෝබර් 17 යන දින වලදී ආයතනය සතු වාහන 02 ක් අනතුරුවලට භාජනය වී තිබුණු නමුත්, ඒ සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ අංශ 08 කට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ නිමකර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පිරිවැය රු.13,978,278 ක් වූ පරිගණක, මෘදුකාංග හා දෘඩාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,223,799 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.1,054,346 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,278,145 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.7,069,499 කින් සේවා වියදම් වැඩිවී තිබුණද පුනරාවර්තන ප්‍රදාන රු.15,917,725 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී ඉකුත් වර්ෂයේදී ඌනතාවයක් වී තිබුණද සමාලෝචිත වර්ෂයේදී අතිරික්තයක් වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමිකය හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී ඉකුත් වර්ෂයේදී රු.35,749,407 ක්වූ දායකත්වය සියයට 32 කින් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.47,013,252 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත හා විශ්වවිද්‍යාල විද්‍යායතන නාමාවලියෙන් හඳුන්වා දී තිබුණු අරමුණු සංක්ෂිප්ත කර පහත දැක්වේ.

(අ) ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 සහ 6 (ඩිප්ලෝමා/උසස් ඩිප්ලෝමා) සඳහා සිසුන් බිහි කිරීමට අදාළ සම්පත් උපරිම ලෙස සම්පාදනය කිරීම.

(ආ) විශ්වවිද්‍යාල විද්‍යායනයේ මානව හා භෞතික සම්පත් සංවර්ධනය හා ඩිප්ලෝමා හා උසස් ඩිප්ලොමා සඳහා ගුණාත්මක තත්ත්ව පද්ධති ප්‍රතිතනය කිරීම.

(ඇ) මානව සම්පත් පුහුණුව හා සංවර්ධනය තුළින් ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා වැඩසටහන් වල ගුණාත්මකභාවය පවත්වා ගැනීම.

(ඈ) විවිධ පාර්ශවයන් සමඟ විශිෂ්ඨ සබඳතා පවත්වා ගැනීම තුළින් සමාජ ප්‍රතිරූපය හා තත්ත්වය පවත්වා ගනිමින් විශ්වවිද්‍යාල විද්‍යායතනය වෘත්තීය හා තාක්ෂණික පුහුණුව ලබා දෙන අද්විතීය ආයතනයක් ලෙස පවත්වා ගෙන යාම.

(ඉ) විශ්වවිද්‍යාල විද්‍යායතනයේ සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ විෂය බාහිර ක්‍රියාකාරකම්, සුභසාධනය හා ප්‍රතිනිර්මිත ක්‍රියාකාරකම් පවත්වා ගැනීම.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ආයතනයේ විවිධ අංශ සඳහා පුහුණු වැඩසටහන් සැලසුම් කර තිබුණද, ප්‍රමාණවත් ගොඩනැගිලි පහසුකම් නොමැතිවීම මත ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(ii) එක් එක් පාඨමාලාව සඳහා උපරිම වශයෙන් සිසුන් 30 දෙනෙකු බඳවා ගත හැකිව තිබුණද සමාලෝචිත වර්ෂයේදී පාඨමාලාවන් 09 ක් සඳහා සිසුන් 06 සිට 27 දක්වා ප්‍රමාණයක් පමණක් බඳවාගෙන තිබුණි.

(iii) ශීතකරණ හා වායුසමන තාක්ෂණය සහ විලේපනවේද කළමනාකරණය (Cosmetology Management) යන පාඨමාලාවන් සඳහා පිළිවෙලින් වර්ෂ 2 සඳහාම සිසුන් 14 දෙනෙකු හා සිසුන් 09 දෙනෙකු ඇතුළත් වී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එම පාඨමාලාවල ඒක ශිෂ්‍ය පිරිවැය පිළිවෙලින් රු.698,482 ක් හා රු.562,447 ක් තරම් ඉහළ අගයන් ගෙන තිබුණි.

(iv) පදනම් පාඨමාලාව සඳහා පත්කර තිබුණු බාහිර දේශකවරුන් 10 දෙනෙකුගේ පත්වීමේ ලිපිවලට අනුව විෂයයන් 10 ක් සඳහා ආවරණය කළ යුතු න්‍යායාත්මක හා ප්‍රායෝගික දේශන පැය 284 ක් හා 372 ක ප්‍රමාණයෙන් පිළිවෙලින් දේශන පැය 25 ක් හා පැය 104 ක් ආවරණය කර නොතිබුණි.

(v) දෙවන සමාසිකය සඳහා පත්කර තිබුණු දේශකවරුන්ගේ පත්වීමේ ලිපි වලට අනුව විෂයයන් 22 ක් සඳහා ආවරණය කළ යුතු න්‍යායාත්මක හා ප්‍රායෝගික දේශන පැය පිළිවෙලින් 1062 ක් හා 733 ක ප්‍රමාණයෙන් පිළිවෙලින් පැය 503 ක් හා පැය 609 ක් ආවරණය කර නොතිබුණි. එම තත්ත්වය එකී පාඨමාලා වල ගුණාත්මකභාවය අඩු වීමට හේතු වී තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු.416,124 ක් අත්තිකාරම් මුදල් ගෙවීම හේතුවෙන් අත්තිකාරම් මුදලින් සියයට 41 ක් හෙවත් රු.172,456 ක් නැවත මුදලින් පියවා තිබුණි.

(ආ) 2015 පෙබරවාරි 16 දින වන විට අමාත්‍යාංශය විසින් විද්‍යායතනයට භාර දී තිබුණු පිරිවැය රු.14,525,000 ක් වූ වාහන දෙකෙහි අයිතිය ආයතනය නමින් පවරා ගැනීමට 2017 අප්‍රේල් 25 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 ජුනි 30 දිනට ගෙවිය යුතු වරිපනම් බදු මුදල රු.7,746 ක් බව මාතර මහා නගර සභාවෙන් දන්වා තිබුණු අතර, හිඟ මුදල් නිරවුල් කර ආහාර දෙපාර්තමේන්තුව නමින් පවතින දේපළ, ආයතනය නමින් සංශෝධනය කර ගැනීමට 2017 මැයි 18 දින දක්වාම කටයුතු කර නොතිබුණු අතර එම හිඟ වරිපනම් බදු සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**---------------------------------**

2014 පෙබරවාරි 10 දිනැති අංක DMS/1670 දරන ලිපියේ උපදෙස්වලට පටහැනිව අදියර 5 සහ 6 සඳහා බාහිර දේශන ගාස්තු පැයක් සඳහා ගෙවිය යුතු මුදල අනුමත කර ගැනීමකින් තොරව අදියර 7 සඳහා අනුමතකළ මුදල පදනම් කරගෙන ගෙවීම් කර තිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

**-----------------------------**

සමාලෝචිත වර්ෂයේ අවසානයට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කථිකාචාර්ය තනතුරු 08 ක හා තාවකාලික ප්‍රදර්ශක හා උපදේශක යන තනතුරුවල එක් පුරප්පාඩුව බැගින්ද, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු 2 ක් ද පැවතුණු නමුත්, එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 5.2 විගණන කමිටු

2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඩී/55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය විසින් විගණන හා කළමණාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත හා තත්‍ය වියදම අතර සියයට 02 සිට සියයට 653 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

විශ්වවිද්‍යාල විද්‍යායතනවල දැනට මුදල් අය කිරීමකින් තොරව පාඨමාලා පවත්වන නමුත් 2015 වර්ෂයේ බඳවාගත් පළමු ශිෂ්‍ය කණ්ඩායමෙන් අය කර ගෙන තිබුණු රු.1,227,000 ක්වූ පාඨමාලා ගාස්තු අමාත්‍යාංශ වෙත යැවීමෙන් අනතුරුව මුදල් සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග කුමක්ද යන්න 2016 අප්‍රේල් 28 දිනැති ලිපියෙන් විමසීමක් කර තිබුණද, 2017 මැයි 31 දින වන විටත් ඊට පිළිතුරු ලැබී නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ඉඩම හා ගොඩනැගිලි සංකීර්ණයේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | (i) පරිගණක, මෘදුකාංග හා දෘඩාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කර නොතිබීම.<br>(ii) වාහන දෙක ආයතනයේ නමට පවරා නොගැනීම සහ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබීම. |
| (ඇ) මූල්‍ය පාලනය | අවශ්‍යතාවය ඉක්මවා අත්තිකාරම් මුදල් ලබා දීම හා අප්‍රමාදව නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |

| | |
|---|---|
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | (i) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවා නොතිබීම.<br><br>(ii) පත්වීමේ ලිපි වල පිටපත් විගණනයට ඉදිරිපත් නොකිරීම. |
| (ඉ) වාහන පාලනය | (i) වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු නොකිරීම.<br><br>(ii) ධාවන සටහන් හා ලොග් සටහන් පොත් අසම්පූර්ණව පැවැත්වීම.<br><br>(iii) ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබීම. |
| (ඊ) මෙහෙයුම් පාලනය | බාහිර දේශකයින්ගේ 7 දෙනෙකුගේ සුදුසුකම් පිළිබඳ තහවුරු නොවීම. |